සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

06 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 50 S I

## නාට්‍ය හා රංග කලාව

කාලය පැය දෙකයි

සැලකිය යුතුයි :- ● ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

### I කොටස

● වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ප්‍රධාන නාට්‍ය ශෛලීන් දෙක වනුයේ,
 1. කෙටි නාට්‍ය හා දිගු නාට්‍ය 2. දුක්ඛදායී හා සුඛදායී 3. ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී 4. පෙරදිග හා අපරදිග

02. ජන කතාවක තිබිය යුතු මූලික ලක්ෂණයක් වන්නේ,
 1. ශ්‍රව්‍ය හා දෘශ්‍ය වීම. 2. පිටපතක් තිබීම.
 3. අධ්‍යක්ෂවරයෙකු සිටීම. 4. මුඛ පරම්පරාවෙන් පැවත ඒම.

03. නාට්‍ය සංවාද අයත් වන්නේ,
 1. ආංගික අභිනයටය. 2. වාචික අභිනයටය. 3. සාත්වික අභිනයටය. 4. ආහාර්ය අභිනයටය.

04. නාට්‍ය පෙළක් යනු,
 1. නාට්‍ය පිටපතකි. 2. නාට්‍යයක කොටසකි. 3. ජන කතාවකි 4. නාට්‍ය කීපයක එකතුවකි.

05. නළුවකු සතු විය යුතු ගුණාංගයක් වන්නේ,
 1. සුන්දර රූ සපුවක් තිබීම. 2. ගායන හැකියාවක් තිබීම.
 3. උසස් පෙළපතකින් පැවත ඒම. 4. අනුකරණ හැකියාවක් තිබීම.

● අංක 06 සිට 09 දක්වා ප්‍රශ්න වලට නොගැළපෙන පිළිතුර තෝරන්න.

06. රංග භාණ්ඩයක් නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ,
 1. සැහැල්ලු බවින් යුක්ත වීම. 2. වටිනාකමින් වැඩි අමුද්‍රව්‍ය යොදා ගැනීම.
 3. නිර්මාණාත්මකව සැකසීම. 4. රංගනයට අදාල වීම.

07. අධිමානුෂික චරිතයක් වන්නේ,
 1. දෙවියා 2. යෝධයා 3. සුරංගනාවක් 4. සෙබලා

08. ක්ෂණික නිරූපණයක් සිදු කිරීමේ දී,
 1. පෙර සූදානමකින් තොරව කළ යුතුය. 2. කෙටි කාලයක් තුළ කළ යුතුය.
 3. පිටපතකට අනුව කළ යුතුය. 4. දෙන ලද මාතෘකාවට අනුව කළ යුතුය.

09. මවගේ චරිතයට අදාළ භූමිකාවක් වන්නේ,
 1. ගුරුවරිය 2. යක්ෂණිය 3. උපාසිකාව 4. සමාජ සේවිකාව

● අංක 10 සිට 13 දක්වා ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| 10. | තොප්පි වෙළෙන්දා | එදිරිවීර සරච්චන්ද්‍ර |
| 11. | ගමරාළ දිව්‍ය ලෝකේ ගිය හැටි | වේදිකා නාට්‍යයකි. |
| 12. | රතු හැට්ටකාරී | සෝමලතා සුබසිංහ |
| 13. | එළොව ගිහින් මෙලොව ආවා | ජන කතාවකි |

● **අංක 14 සිට 16 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් සුදුසු පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.**

**(නාඩගම්, කෝලම්, චලන, නිර්මාණශීලීත්වය , හැඟීම්, පරිකල්පනය)**

14. යම් දෙයක් පිළිබඳව අළුතින් යමක් සිතීමට හා මැවීමට ඇති හැකියාව ........................................................................ නම් වේ.

15. පුද්ගලයෙකු ඉදිරිපත් කරන දුක, සතුට, ලැජ්ජාව, පිළිකුල ආදිය .................................................... නම් වේ.

16. වෙස් මුහුණු යොදා ගනිමින් රඟ පානු ලබන නාට්‍ය විශේෂය වන්නේ ........................................................... ය.

● **අංක 17 සිට 20 දක්වා ප්‍රශ්න වලට හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

17. අනුකරණය බාහිර හා අභ්‍යන්තර වශයෙන් ප්‍රභේද දෙකකි. (......................)

18. වේදිකා නාට්‍යයේ විශේෂම ලක්ෂණය වන්නේ සජීවී බවය. (......................)

19. නාට්‍යයක් සඳහා ප්‍රේක්ෂකයා අත්‍යාවශ්‍ය නොවේ. (......................)

20. නළුවකු කරනු ලබන රංගනය රූපණය නම් වේ. (......................)

(2 x 20 = 40)

## II කොටස

● **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.**

(01) පුංචි අපට දූන් තේරෙයි නාට්‍ය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. පුංචි අපට දූන් තේරෙයි නාට්‍යයේ අධ්‍යක්ෂවරයා කවුද?
ii. මෙම නාට්‍යයේ මීයන්ට කැවුම් කෑමට නොහැකි වූයේ කුමන හේතුවක් නිසාද?
iii. කුකුල් හාමිගේ චරිතයෙන් ලබාගත හැකි ආදර්ශ 2 ක් ලියන්න.
iv. මෙම නාට්‍යයේ තේමාව කුමක් ද?
v. මෙම නාට්‍යයේ ගායක පිරිස සැරසී සිටින්නේ කුමන ආකාරයකට ද? (2 x 5 = 10)

(02) i. ජනක්‍රීඩාවක් යනු කුමක් ද? (ල. 02)
ii. ඔබ දන්නා ජන ක්‍රීඩා 03 ක් නම් කරන්න. (ල. 03)
iii. ජනක්‍රීඩා කිරීම තුළින් අපට ලැබෙන ප්‍රයෝජන මොනවාද? (ල. 05)

(03) i. අභිනය යන්න පැහැදිලි කරන්න. (ල. 02)
ii. අභිනයේ ප්‍රභේද නම් කරන්න. (ල. 03)
iii. ඉන් ඔබ කැමති අභිනය ප්‍රභේද දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(04) i. රංග ආභරණ සැකසීම සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය 4 ක් ලියන්න. (ල. 02)
ii. රංග ආභරණ සැකසීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් ලියන්න. (ල. 03)
iii. ඔබ කැමති රංග ආභරණයක් ඇඳ එය සකසන ආකාරය පියවර වශයෙන් ලියා දක්වන්න. (ල. 05)

(05) i. කතන්දරයක් යනු කුමක්දැයි හඳුන්වන්න. (ල. 02)
ii. කතන්දරයක මූලික ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)
iii. කතන්දරයක හා නාට්‍යයක ඇති සමානතා සහ අසමානතා වගුගත කරන්න. (ල.05)

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
# නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

## 06 ශ්‍රේණිය

I කොටස

01 - 3
02 - 4
03 - 2
04 - 1
05 - 4
06 - 2
07 - 4
08 - 3
09 - 2
10 - සෝමලතා සුබසිංහ

11 - ජන කතාවකි
12 - වේදිකා නාට්‍යයකි
13 - එදිරිවීර සරච්චන්ද්‍ර
14 - පරිකල්පනය
15 - හැඟීම්
16 - කෝලම්
17 - ✗
18 - ✓
19 - ✗
20 - ✓

**06 ශ්‍රේණිය**

# නාට්‍ය හා රංග කලාව
# ප්‍රායෝගික පරීක්ෂණය - 2019

**( ගුරුවරුන් සඳහා පමණි )**

- **ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සියලු ම සිසුන් සහභාගී විය යුතුය.**
- **කාලය උචිත පරිදි යොදා ගන්න.**

(01) ◆ ඔබ කැමති නාට්‍ය ගීතයක් රූපණය සමඟ ඉදිරිපත් කරන්න.
(ගායනය , රංගනය හොඳින් ඉදිරිපත් කළේ නම් නියමිත ලකුණු ලබා දෙන්න.

◆ සම්පූර්ණ ගීතය ගායනය කළ යුතුය.

◆ අංග චලන හා භාව ප්‍රකාශන සහිත විය යුතුය.

◆ නියමිත නාද මාලාවට අනුව ගායනය කළ යුතුය.

(02) නිර්දිෂ්ඨ නාට්‍ය පෙළ (පුංචි අපට දූන් තේරෙයි) ඇසුරින් සංවාද කොටසක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

◆ නාට්‍ය ශෛලිය ඉස්මතු කිරීම.

◆ හඬ පෞරුෂය

◆ සහජ හැකියාවන්

◆ චරිතය පිළිබඳ අවබෝධයට ලකුණු ලබා දෙන්න.

(03) කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම.

◆ ජන කතා

◆ සුරංගනා  කතා

◆ උපමා කතා

◆ සමකාලීන සිදුවීම් ඇසුරු කර ගත් කතා

◆ වෙනත් සුදුසු කතා  යොදා ගත හැක.

◆ කතා පුවතක්  නාට්‍යානුසාරීව රඟ දැක්වීම පිළිබඳ මනා අවබෝධයෙන් සිදුකරන ඉදිරිපත් කිරීම් සඳහා  නියමිත ලකුණු ලබාදෙන්න.

(04) එසැණ නිරූපන

කුසපත් ඇදීමක් මඟින් සිසුන්ට පහත මාතෘකා  තෝරා ගැනීමට අවස්ථාව ලබාදෙන්න.

1. තමා ආදරය කරන ගුරුවරයා පාසලින් අස්වී යාම.
2. දිය නෑමට ගිය විට මැණිකක් ලැබීම.
3. නිවසට ආ අමුත්තා අතුරුදන් වීම.
4. තමාට ලැබුණු නායක කම එපාවීම.
5. පාසලින් ලැබුණු අපූරු තෑග්ග
6. මා දුටු අපූරු / නපුරු සිහිනය

(05) කෙටි නාට්‍ය රඟ දැක්වීම. (සමූහ)

◆ පෙර දැනුම් දුන් පරිදි සිසුන් සූදානම් ව පැමිණෙන කෙටි නාට්‍යයක් රඟ දැක්වීම.

◆ කුමන හෝ අවස්ථාවක් හෝ සිදුවීමක් මේ සඳහා යොදා ගත හැක.

◆ සුදුසු පරිදි ගුරුවරයා විසින් සිසුන් කණ්ඩායම් ගත කරන්න. ( කණ්ඩායමට ළමුන් 5 - 7 විය යුතුයි.)